# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය | නර්තනය I කොටස | කාලය පැය 01 යි

නම:- ........................................................................................................

පාසල:- ..............................................................................

(01).කොහොඹ කංකාරි ශාන්ති කර්මයේ ප්‍රධාන සැරසිල්ල .................................................. ලෙස නම් කෙරේ.

i.තොරණ ii.මල්යහන iii.අයිලය iv.කාලපන්දම් ගස

(02).තත් තත් කක්කඩ කඩතක ................................../ගුදිත ගදිත ගත ගත් දැහිං ගුං දැහිං ..........................
මෙම කස්තිරම/ ඉරට්ටිය නටනු ලබන්නේ,

i.8 වන ගොඩ සරඹය. ii.10 වන ගොඩ සරඹය.

iii.11 වන ගොඩ සරඹය. iv. 12 වන ගොඩ සරඹය.

(03).නර්තන ක්‍රියාකාරකම් කිරීම තුළින් වර්ධනය වන හැකියාවක් නොවන්නේ,

i.සමබරතාව රැක ගැනීමට නොහැකි වීම.

ii.නායකත්වයට ගරු කිරීම.

iii.තර්කානුකූල චින්තනය.

iv. නිර්මාණශීලී චින්තනය.

(04).ගැමි නැටුම් අතරින් "අටමගලේ කවි" භාවිතා කෙරෙන්නේ

i.පන් නැටුමේදීය. ii.තාලම් නැටුමේදීය.

iii.මෝල්ගස් නැටුමේදීය. iv. කුළු නැටුමේදීය.

(05).අදහස් ප්‍රකාශ කිරීමෙන් තොරව සම්ප්‍රදායන්ට අයත් පද කොටස් නර්තනය කිරීම දක්නට ලැබෙන්නේ,

i.ගැමි නැටුම් තුළිනි. ii.ගැමි නාටක චරිත මඟිනි.

iii.වන්නම් තුළිනි. iv. නාට්‍යමය අවස්ථා මඟිනි.

(06).රජයේ පාසල් වන සෞන්දර්ය විෂය අනිවාර්යය වූයේ,

i.1934 දීය. ii.1943 දීය. iii.1972 දීය. iv.1974 දීය.

(07).දෙවොල් ගොඩ බැසීම, අඹ විදමන, මරා ඉපැද්දවීම යන නාට්‍යමය අවස්ථා දක්නට ලැබෙන්නේ,

i.කොහොඹාකංකාරියේ දී ය. ii.දෙවොල් මඩු ශාන්තියේ දී ය.

iii.රටයකුමේ දී ය. iv. සන්නි යකුමේ දී ය.

(08). 'කට දොඩවන්නේ ගිය ගිය තැන පෙරලෙන්නේ' මෙම කවි පදයෙන් කියවෙන චරිතය වන්නේ,

i.ජසයාගේ චරිතය. ii.ගුරුහාමිගේ චරිතය.

iii.පරයාගේ චරිතය. iv. අණබෙරකරුගේ චරිතය.

(09).ප්‍රස්ථාරකරණය යනුවෙන් හඳුන්වන්නේ,

i.ප්‍රායෝගික කොටස් භාවිතා වන අක්ෂර ලියා දැක්වීමයි.

ii.විලම්භ, මධ්‍ය, දෘත, යන ත්‍රිවිධ ලය භාවිතා වන අයුරු ලියා දැක්වීමයි.

iii.ලඝු, ගුරු, ප්ලුත මාත්‍රා වෙන් කර දැක්වීමයි.

iv. තාල සංඥා මඟින් තිත වාදනය වන අයුරු දැක්වීමයි.

(10).අද්භූත රසය ජනිත වීම සඳහා මුල්වන ස්ථායිභාවය වන්නේ,

i.හාසය. ii.විශ්මය. iii.ශම. iv. උත්සහ.

(11).නළුවා තම නිර්මාණය සාර්ථක කර ගැනීම සඳහා බාහිරින් ලබා ගත් දේ,

i.ආංගික අභිනය වේ. ii.සාත්වික අභිනය වේ.

iii.වාචික අභිනය වේ. iv. ආහාර්ය අභිනය වේ.

(12).මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භයට හේතු වූ 'ශාප් මෝචන්' මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

i.උදය ශංකර් ය. ii.රවීන්ද්‍රනාත් තාගෝර් ය.

iii.රුක්මණි දේවී අරුන්ඩේල් ය. iv. චිත්‍රසේන ඩයස් ය.

(13). අනාසාතාත්මක ලක්ෂණ වලින් යුත් ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්ති පූර්වකව ගායනා කෙරෙන ගායනා විශේෂයකි.

i.ආශිර්වාද ගායනා ය. ii.නමස්කාර ගායනා ය.

iii.සිරස පාද ගායනා ය. iv. කඩතුරා කවි ගායනා ය.

(14). ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට අධිපති වන්නේ...................... මෙම කවියෙන් කියවෙන්නේ,

i.කුජ ග්‍රහයා පිලිබඳවය. ii.හිරු ග්‍රහයා පිලිබඳවය.

iii.බුධ ග්‍රහයා පිලිබඳවය. iv. ගුරු ග්‍රහයා පිලිබඳවය.

(15). දෙව්නුවර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන්ගේ නර්තනයක් පිළිබඳ තොරතුරු දක්වා ඇති දේශාටන වාර්තාකරු නම්,

i.ඉබන් බතූතා .　　　ii.ස්පිල් බර්ජන්.

iii.රොබට් නොක්ස්.　　　iv. පාහියන් භික්ෂූන් වහන්සේ

(16).කථකලී නර්තන සම්ප්‍රදාය වර්තමාන තත්වයට සකස් කරන ලද්දේ,

i. උදය ශංකර් විසිනි.　　　ii.රවීන්ද්‍රනාත් තාගෝර් විසිනි.

iii.මීනාක්ෂි සුන්දරම් පිල්ලේයි විසිනි.　　　iv. මහා කවි වල්ලතොල් නාරායන් මෙනන් විසිනි.

(17). අසුර යක්කම, පොත්කඩේ යක්කම, අන්තර්ගත ශාන්ති කර්මය වන්නේ,

i.දෙවොල්මඩු ශාන්ති කර්මය.　　　ii.කොහොඹාකංකාරී ශාන්ති කර්මය.

iii.පහන් මඩු ශාන්ති කර්මය.　　　iv. රටයකුම ශාන්ති කර්මය.

(18).රන් කිකිළි, ගිනිහොරා, හපනා, සේපාලිකා යන මුද්‍රා නාට්‍ය නිශ්පාදනය කරන ලද්දේ,

i.ආචාර්‍ය මිරුන්ඩා හේමලතා මහත්මිය.　　　ii.චන්ද්‍ර ලේඛා මහත්මිය.

iii.ආචාර්‍ය වජිරා චිත්‍රසේන මහත්මිය.　　　iv. එස්.පණිභාරත මහතා.

(19). බුදුන්, දෙවියන්, රජවරුන් හා රදල ප්‍රභූන් ආදීන්ගේ ගුණ වර්ණනා කරන ගායනා විශේෂයක් වන්නේ,

i.හටන් කවි.　　　ii.ප්‍රශස්ති කවි.　　　iii.චාමර කවි.　　　iv. සවරන් කවි.

(20). තෝඩායම්, පුරාපට් යන නර්තන අංග අයත් වන්නේ,

i.භාරත නර්තනයට ය.　　　ii.සබරගමු නර්තනයට ය.

iii.කථකලි නර්තනයට ය.　　　iv. මනිපුර් නර්තනයට ය.

- **ප්‍රශ්න 21 සිට 25 දක්වා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න**

| පේලිය | A කොටස | B කොටස | C කොටස |
|---|---|---|---|
| 1 පේලිය | තොරන් යාගය. | අස්නය නැටීම | වාහල් නැටීම |
| 2 පේලිය | අක්යාල වෙන් කිරීම. | මගුල් බෙර වාදනය | මිල්ල පේ කිරීම |
| 3 පේලිය | ඌරා යක්කම. | පත්තිනි නැටීම | හත්පද/ හත් පද පෙළපාළි |
| 4 පේලිය | අයිලය යැදීම. | අත්‍යා බෙර වාදනය | කප් සිටුවීම |

(21). උඩරට, පහතරට, සබරගමු, සම්ප්‍රදාය ත්‍රිත්වයේ දක්නට ලැබෙන නර්තන අංගය ඇතුලත් වන්නේ,

i. 1 පේලියේ C කොටස.　　　ii. 3 පේලියේ C කොටස.

iii.1 පේලියේ B කොටස.　　　iv. 3 පේලියේ A කොටස.

(22). පහතරට සම්ප්‍රදායේ ගායනය ප්‍රධාන තැනක් හිමි නර්තන අංගයක් ලෙස සඳහන් කල හැකි නර්තන අංගය ඇතුලත් වන්නේ,

i.1 පේලියේ A කොටස.　　　ii. 2 පේලියේ C කොටස.

iii.3 පේලියේ B කොටස.　　　iv. 1 පේලියේ B කොටස.

(23). සම්ප්‍රදායන් තුනෙහිම එකම අරමුණකින් පවත්වන පොදු චාරිත්‍රය ඇතුලත් වන්නේ,

i. 4පේලියේ A කොටස. ii. 4 පේලියේ B කොටස.

iii.4 පේලියේ C කොටස. iv. 2 පේලියේ A කොටස.

(24). දෙබස් හා සංවාද සමඟ හාස්‍ය රසය ඉදිරිපත් කරන නාට්‍යමය අවස්ථාව ඇතුලත් වන්නේ,

i. 1පේලියේ C කොටස. ii. 4 පේලියේ A කොටස.

iii.3 පේලියේ C කොටස. iv. 3 පේලියේ A කොටස.

(25). සෑම ශාන්ති කර්මයකටම පොදු වාදන අවස්ථාවක්,

i. 4 පේලියේ B කොටස. ii. 2 පේලියේ B කොටස.

iii.3 පේලියේ C කොටස. iv. 1 පේලියේ A කොටස.

A



B



C



D



(26). B රූපයේ දැක්වෙන චරිතය රඟදක්වන රඟමඩල ................................ ලෙස හැඳින්විය හැක.

i.කමත. ii. තානායම්පොළ. iii.කරලිය. ivරඟමඩල.

(27).ලෙන්චිනා චරිතය සමඟ බැඳී ඇති අනෙක් චරිතය දැක්වෙන්නේ .................................. යෙනි.

i. A රූපයෙනි. ii. B රූපයෙනි.

iii.C රූපයෙනි. iv. A සහ C රූපයෙනි.

(28). නල දමයන්ති හංස දේනුවගේ චරිතයට පණ පොවන ලද්දේ,

i. වජිරා චිත්‍රසේන මහත්මියයි.

ii. මිරැන්ඩා හේමලතා මහත්මියයි.

iii. චන්ද්‍රා ලේඛා මහත්මියයි.

iv. අංජලිකා චිත්‍රසේන මහත්මියයි.

(29). මන්ද මානසික දරුවන්ගේ නර්තන කුසලතා ඔප් නංවා, එම දරුවන් සමාජගත කිරීමේ මහඟු මෙහෙවර කිරීමේ ගෞරවය හිමිවන්නේ,

i. වජිරා චිත්‍රසේන මහත්මියටයි.

ii. මිරැන්ඩා හේමලතා මහත්මියටයි.

iii.චන්ද්‍රා ලේඛා මහත්මියටයි.

iv. අංජලිකා චිත්‍රසේන මහත්මියටයි.

(30). මෝල්ගස් නැටුම නිර්මාණය කරන ලද්දේ,

i. එස්.පණිභාරත මහතා. ii. වජිරා චිත්‍රසේන මහත්මියයි.

iii.කේ.එස්.ප්‍රනාන්දු මහතා iv. මිරුන්ඩා හේමලතා මහත්මියයි.

## II කොටස - උඩරට නර්තනය සම්ප්‍රදාය

(31). දහ වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,

i. පැනීමේ සරඹය. ii. බඹර සරඹය. iii.චන්ද්‍රිකා සරඹය iv.ඇල සරඹය.

(32). සිංහරාජ වන්නමට අයත් බෙර පදය වන්නේ,

i. දොං දොංජිං ජිං ගජිගත. ii. දොං ජිංත ගත දොංත.

iii.දොදොංත තකුදොං. iv.දෝං ජිං ජිං තකට දොංතක.

(33). දොං ජිංත ගත දොංත වට්ටමට අයත් තාල රූපය.

i. මාත්‍රා 2 + 2 සුළුතනි තිත. ii. මාත්‍රා 3 + 4 දෙතිතේ තාල රූපය.

iii. මාත්‍රා 2 + 4 දෙතිතේ තාල රූපය. iv. මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපය.




(34). ඉහත රූපයේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ,

i. කෛයිමෙත්ත. ii. අවුල් හැරය.

iii. පොත්පොට. iv. හඟල.

(35). B අක්ෂරයෙන් දැක්වෙන්නේ වෙස් ඇඳුම් කට්ටලයේ,

i. ශිඛා බන්දනය. ii. නෙත්ති මාලය.

iii. කෛයි මෙත්ත. iv. පාහින් පත.

(36). කුදාංත ගත දොං වට්ටම නර්තනය කරනු ලබන්නේ,

i. මාත්‍රා 2 + 2 + 3 තුන්තිතටය. ii. මාත්‍රා 2 + 3 + 4 තුන්තිතටය.

iii. මාත්‍රා 3 + 3 + 4 තුන්තිතටය. iv. මාත්‍රා 2 + 2 + 4 තුන්තිතටය.

(37). උඩරට වන්නම් ව්‍යුහයේ ඇතුලත් කොටස් ගණන,

i. 5 කි. ii. 4 කි. iii. 6 කි. iv. 7 කි.

(38). 'තාංජිංතත් තත් - ජිංතත් ජිං තත් තත්' මෙම පද කොටස ,

i. කුදගත ගත දොං වට්ටමේ පළමු අඩව්වට අයත් වේ.

ii. කුදාංත ගත දොංත වට්ටමේ දෙවැනි අඩව්වට අයත් වේ.

iii. දොංජිංත ගත දොංත වට්ටමේ පළමු අඩව්වට අයත් වේ.

iv. දොංජිංත ගත දොංත වට්ටමේ දෙවැනි අඩව්වට අයත් වේ.

(39). මුසල්ඩි වන්නමේ 'වන පැත්ත බිය පත්ව සයනම්' යන කවිපදයේ මාත්‍රා 3+3 තාලයට කරන කොටස වන්නේ,

i. හිරුත් අවර ගිරත් පැමිණ... ii. දුටත් යනෙන විටත් දුවන...

iii. කලත් වසන තැනින් දුවන... iv. ගමනක් යන විලසක්...

(40). ඇස් පණිහාරත, නිත්තවෙල ගුණයා යන නර්තන ශිල්පීන් ප්‍රවීනත්වය දැක්වූයේ,

i. පහතරට නර්තන සම්ප්‍රදායටය. ii. සබරගමු නර්තන සම්ප්‍රදායටය.

iii. උඩරට නර්තන සම්ප්‍රදායටය. iv. විදේශිය නර්තන සම්ප්‍රදායටය.

## <u>II කොටස - පහතරට නර්තනය සම්ප්‍රදාය</u>

(31). ගුහිත ගදිරිකිට ගුද ගුද ගුම් දිත් තා -

ගහිති ගදිරිකිට ගත ගත ගත් දිත් තා -

i. නමවන ඉලංගම් සරඹය. ii. දහවැනි ඉලංගම් සරඹය.

iii. එකොලොස් වන ඉලංගම් සරඹය. iv. දොලොස්වැනි ඉලංගම් සරඹය.

(32). අනුරාග දණ්ඩ තාලය සිංදු වන්නමට අයත් බෙරපදය වන්නේ,

i. දොංතම් ගත ගදිතම් ගත ගුගුදම් ගත ගදිතම්.

ii. ගද ගතිගත ගුද ගුද ගදිගත.

iii. තක දීත් තක දොං දොං දීම් තක දොං

iv. දිත්තම් දිතකු දොම් දොම් තා.

(33). 'ගුද ගති ගත' වට්ටමට අයත් තාල රූපය

i. මාත්‍රා 2 + 3 (සුළු මැදුම්) දෙතිතටය. ii. මාත්‍රා 2 + 4 (සුළු මහ) දෙතිතටය.

iii. මාත්‍රා 3 + 3( මැදුම්) තනිතිතටය. iv. මාත්‍රා 2 + 2 (සුළු) තති තිතටය.




(34). ඉහත රූපයේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයේ,

i. කරපටිය. ii. හැට්ටය. iii. ජටාව. iv. තෙල්කච්චිය.

(35). ඉහත රූපයේ B අක්ෂරයෙන් දැක්වෙන්නේ තෙල්මේ ඇඳුම් කට්ටලයේ,

i. හස්තකඩය. ii. ඉන හැඩය. iii. තෙල්කච්චිය. iv.පිජාම කලිසම

(36). ශුද්ධ තාලය සිංදු වන්නම නර්තනය කරනු ලබන්නේ,

i. මාත්‍රා 3 + 3 +4 තාල රූපයටය. ii. මාත්‍රා 2 + 3 + 4 තාල රූපයටය.

iii. මාත්‍රා 2 + 2 + 4 තාල රූපයටය.. iv. මාත්‍රා 2 + 2 + 3 තාල රූපයටය.

(37). පහතරට සිංදු වන්නම් වල ව්‍යුහය අනුපිළිවෙලින් කොටස්,

i. 5 කි. ii. 6 කි. iii. 4 කි. iv. 7 කි.

(38). ගුංදත් ගුහිතිගදිරිකිට ගත ගත // ගහිති ගතම් තත් දිත් තත් දිගතං දොං මෙම පදය,

i. ගුඳ ගතිගත වට්ටමේ පළමු පදය වේ.

ii. ගුඳ ගතිගත වට්ටමේ අන්තාඩිය වේ.

iii. ගුඳ ගතිගත වට්ටමේ දෙවැනි පදය වේ.

iv. ගුඳ ගතිගත වට්ටමේ දෙවැනි ඉරට්ටිය වේ.

(39). පහතරට ශුද්ධ තාලය සිංදු වන්නමේ පළමු කවි පදය වන්නේ,

i. සිරිලක පවර දෙව් නුවරෙහි වෙසෙසවනා.

ii. සිරි පිරි ගිරි මුදුනත සුරපුර ලෙසිනා

iii. සිරි සඳ වනැති සිරිකත සමගිව වෙසෙනා

iv. සුරිඳුනි අසනුම කියන බස් බැති පෙමිනා.

(40). කේ.එස්.ප්‍රනාන්දු, සච්රිස් සිල්වා යන නර්තන ශිල්පීන් ප්‍රවීණත්වයක් දැක්වූයේ,

i. උඩරට නර්තන සම්ප්‍රදායටය.

ii. සබරගමු නර්තන සම්ප්‍රදායටය.

iii. පහතරට නර්තන සම්ප්‍රදායටය.

iv. විදේශිය නර්තන සම්ප්‍රදායටය.

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

11 ශ්‍රේණිය | නර්තනය II කොටස | කාලය පැය 02 යි

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්නය 5කට පිළිතුරු සපයන්න.

(1)

1).කෝට්ටේ යුගයේදී රචනා කරන ලද මුල්ම ප්‍රශස්ති කාව්‍ය ලෙස සැලකෙන්නේ ............................................. ........................ ය.

2).දොංතකු// දොංජිං ගත් තත් ජිංතරිකිට/ දිත්තම් දිතකු දොං දොං තා යන බෙරපදය මාත්‍රා .................................. .................................................... තාල රූපයට අයත් වේ.

3). වැදියකුන් හා මෙලෙයි යකුන් පුද ලබන්නේ ..................................................................... ශාන්ති කර්මයේදීය.

4). දෙනෙත් අන්ධ බ්‍රාහ්මණයකුට පෙනීම ලබා දෙනු ලෙස උපුල්වන් දෙවියන්ට පූජෝපහාර පිණිස .................... ............................................ රචනා කල බවට මතයක් පවතී.

5). තානායම්පොළ පිටුපසින් නළුවන්ට මුවා වී රඟමඩලට පැමිණීම සඳහා ගොරකා අතු බුරුල්ල අතු වලින් .............................................................................නිර්මාණය කර ඇත.

6). බලි ශාන්ති කර්මයෙහි බලි ඇඳුරා එක් අතකට පුවක් මල් කිනිත්තක් හෝ පන්දමක් ද අනෙක් අතට .............................................................................. ද භාවිතා කරයි.

7). බෞද්ධාගමික උත්සව අවස්ථාවන්හි සුවිසි විවරණ, සත්සති ආදි බුදුගුණ ගායනා කෙරෙන ............................ ...................................................................... නර්තනය පත්තිනි දෙවියන් හා සම්බන්ධ වේ.

8). සෞන්දර්ය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් වුයේ ............................................... වර්ෂය තුලදීය.

9). කථකලි නර්තනයෙහි ප්‍රධාන ගායකයා ....................................................... වන අතර අනු ගායකයා ...................................................................... ලෙස හැඳින්වේ.

10). 'හනික වරෙව් කොල්ලනේ' .... යන ගීතය ....................................................... නාට්‍යයේ ඇතුලත් වන අතර විදුර නාටකයේ 'මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ'... ගීතය රචනා කල රචකයා .................................... ..................................ය.

(2)

i. දොංජිංත ගත දොංත/ ඝුද ගතිගත වට්ටමේ පදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

ii. කඩු/ මෝල් ගස් නර්තනයට අදාල කවියක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

iii. කුදංතගත දොං/ ඝුද ගතිගත වට්ටමට අයත් අඩව්වක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

(3).

i. ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ තොරතුරු වංශකථා දෙකක් ඇසුරින් සාධක ලියන්න. (ලකුණු 04)

ii. නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති අයුරු නිදසුන් දෙකක් ගෙන විස්තර කරන්න. (ලකුණු 04)

iii. ආගමික අවශ්‍යතා සඳහා නර්තනය යොදා ගැනීම පිළිබඳ තොරතුරු විදේශීකයින්ගේ වාර්තා දෙකක් ගෙන විස්තර කරන්න. (ලකුණු 04)

(4).

i. වන්නම් පිළිබඳ තොරතුරු ඇතුළත්ව රචනා වී ඇති ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 04)

ii. වන්නම් වල පොදු ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

iii. වන්නම් රචනා කිරීමේ අරමුණු පැහැදිලි කරන්න. (ලකුණු 04)

(5). පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. සතර අභිනය. ii. ලය

iii.ග්‍රහ පන්ති iv . අංග රචනය.

v. ප්‍රශස්ති. (ලකුණු 04 x 3)

(6).

i. කෝලම් නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

ii. කෝලම් රඟමඬල පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04)

iii. චරිත නිරූපනය සඳහා සාම්ප්‍රධායික බෙර පද හා ගායනය යොදා ගෙන ඇති අයුරු එක් චරිතයක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

(7).

i. 1930 දශකයේ නිෂ්පාදනය වූ මුද්‍රා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භය හා පසුබිම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iii. කරදිය/ කුඹී කථාව එක් මුද්‍රා නාට්‍යක් තෝරාගෙන එහි සාර්ථකත්වයට භාවිතා කර ඇති ශිල්ප ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

(8).

i. නර්තන කලාවේ නව ප්‍රවනතා හතරක් නම් කරන්න. (ලකුණු 04)

ii. ප්‍රාසාංගික බව හා විවිධාංගීකරණය සඳහා භාවිතා වන තාක්ෂණික උපක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ව්‍යවහාරික නර්තනය, වෘත්තිය ශිල්පීන් බිහි වීම පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 04)